International
Labour
Office

# HIV සහ AIDS

## සහ වැඩ ලෝකය සැලකිල්ලට ගනිමින් කෙරෙන නිර්දේශය 2010 (අංක 200)



ILO AIDS
www.ilo.org/aids

# HIV සහ AIDS සහ වැඩ ලෝකය සැලකිල්ලට ගනිමින් කෙරෙන නිර්දේශය 2010 (අංක. 200)

ප්‍රකාශන අයිතිය - ජාත්‍යන්තර කම්කරු සංවිධානය 2010

ප්‍රථම මුද්‍රණය 2010

ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ ප්‍රකාශන විශ්ව ප්‍රකාශන සම්මුතියේ 2 වන සන්ධානය යටතේ ප්‍රකාශන අයිතිය ජාත්‍යන්තර කම්කරු කාර්යාලය භුක්ති විඳියි. කෙසේ වෙතත් ලබා ගන්තා වූ මූලාශ්‍රයන් සඳහන් කිරීමේ කොන්දේසියට යටත්ව එම ප්‍රකාශන වල කෙටි උධෘත අවසරයකින් තොරව නැවත පළ කිරීමේ හැකියාව තිබේ. කෙසේ වෙතත් නැවත පල කිරීම හා පරිවර්තනය කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ CH - 1217 ජිනීවා 22 හා පිහිටි ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ ප්‍රකාශන කාර්යාංශය (අයිතීන් සහ අවසර දීම්) වෙත ඉල්ලුම් කිරීම හෝ pbbdroit@ilo.org වෙත ඊමේල් කළ යුතුය. ජාත්‍යන්තර කම්කරු කාර්යාලය එවැනි ඉල්ලීම් සුහදව පිළිගනී.

වෙනත් රටවල පිහිටා ඇති නැවත පල කිරීමේ අයිතීන් පිළිබඳ අනුබද්ධිත සංවිධානවල ලියාපදිංචි පුස්තකාල, අයාතන හා අනෙකුත් පරිශීලනය කරන්නට මේ සම්බන්ධයෙන් ලබා දී ඇති අවසරයන්ට අනුව ඡයා පිටපත් ලබා ගත හැකිය. නැවත පළ කිරීමේ අයිතිය පිළිබඳ දැනගැනීමට www.ifrro.org වෙබ් අඩවිය වෙත යන්න.

---

*Recommendation concerning HIV and AIDS and the world of work, 2010 (No.200)*
International Labour Office, Geneva, 2010

ISBN : 978-92-2-824346 - 8 (print) ; 978-92-2-824347-5 (Web pdf)

HIV/AIDS occupational health/occupational safety/workers' right /ILO Recommendation
/text
15.04.2

Also available in French: *Recommandation (nº 200) concernant le* VIH *et le sida et le monde du travail, 2010* [ISBN 978-92-2-223819-4 (print); 978-92-2-223820-0 (Web pdf)], Geneva, 2010; and in spanish: *Recomendation sobre el VIH y el sida y el munado del trabajo, 2010 (num.200)* [ISBN 978-92-2-323819-3(print): 978-92-2-323820-9 (Web pdf)], Geneva, 2010

*ILO Cataloguning in Publication Data*

---

එක්සත් ජාතීන්ගේ පරිචයන් අනුව යමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශනයන්හි යොදා ඇති නිල නාම සහ ඉදිරිපත් කර ඇති විස්තර පාඨ ආදියෙන් කිසියම් රටක ප්‍රදේශයක හෝ යටත් ප්‍රදේශයක නිල තත්වය සම්බන්ධයෙන් හෝ දේශසීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් හෝ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මතය හෝ අදහස එය යයි කිසිසේත් අදහස් නොවේ.

අත්සන් කළ ලිපි, අධ්‍යයනයන් හා වෙනත් දායක ලේඛනවල ගැබ්ව ඇති මත සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම කර්තෘවරුන් සතුයි. ඒවා පල කිරීමෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය එම මතයන් හෝ අදහස් අනුමත කරන බවක් අදහස් නොකෙරේ.

යම් සමාගමක වෙළඳ නිෂ්පාදනයක හෝ ක්‍රියාවලියක නාමයක් ගැන සඳහන් වෙතොත්, ජාත්‍යන්තර කම්කරු කාර්යාලය ඒවා නිර්දේශ කරන බව හෝ සමාගමක්, නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහන් නොවූ පමණින් ඒවා නිර්දේශ නොකරන බව හෝ අදහස් නොවේ.

මෙම ප්‍රකාශන ප්‍රධාන පෙළේ පොත් වෙළෙන්දන් හෝ බොහෝ රටවල ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය කාර්යාල වලින් හෝ කෙලින්ම ස්විට්සර්ලන්තයේ කා-1211 ජිනිවා 22, ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ ජා. ක. ස ප්‍රකාශන ලබා ගත හැකිය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පොත් පිළිබඳ ලැයිස්තු හා නාමාවලින් ඉහත කී ලිපිනයන්ගෙන් නොමිලයේ ලබා ගත හැකිය. නැතහොත් ඊමේල් මගින් ලබාගත හැකිය. ඊමේල් pubvente@ilo.org නැතිනම් අපගේ වෙබ් අඩවිය වෙත යන්න. www.iol.org/publns

---

ශ්‍රී ලංකාවේදී මුද්‍රණය කරන ලදි.

# පූර්විකාව

HIV/AIDS සහ හා වැඩ ලෝකය සම්බන්ධ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ ලියවිල්ල හා ඊට අනුගාමී ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි ත්‍රෛපාර්ශ්වික ආයතනයන්හි ප්‍රබල සහයෝගය පිළිඹිබු කරන එම නිර්දේශ ප්‍රවර්ධනය හා ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනා මෙම පොත් පිංචෙහි අඩංගු වේ.

HIV වසංගතය වනාහි වර්තමාන ලෝකයේ සෞඛ්‍ය සංවර්ධනය හා ආර්ථික හා සමාජීය අභිවෘද්ධිය මුහුණ දෙන ප්‍රබල අභියෝගයන් ගෙන් එකකි. HIV සහ AIDS නිසා වඩාත්ම බලපෑමට ලක්වූ රටවල් දශක ගණනාවක් තුල ඇතිකරගත් සංවර්ධනයේ ප්‍රතිලාභයන් හෝදාපාලුවට ලක් වී ඇත. එම රට වල් ආර්ථික පසු බෑමටත්, ප්‍රජාවන් අස්ථාවර තත්ත්වයටත් පත්ව ඇත. බොහෝ රටවල සහ ප්‍රජාවන් රෝගීවීමේ හා මරණ ඇතිවීමේ ප්‍රධාන හේතුවක් ලෙස HIV පවතිනු ඇතැයි අපේක්ෂිතය.

සුනිසි මෙහෙවර හා යා දෙන සංවර්ධනය ගොඩනගා ගැනීමෙහි ලා සැලකිය යුතු බාධකයක් ලෙස HIV කැපී පෙනෙයි. HIV හා AIDS වලින් පීඩාවට පත් දශලක්ෂ ගණන් පුද්ගලයන් ගේ ජීවනෝපාය නැතිවීමට එය මග පාදා ඇත. එහි අනිටු ප්‍රතිඵලයන් විශේෂයෙන්ම බලපා ඇත්තේ ඵලදායී වයස් කාණ්ඩවල අයවලුන් අතර හෙයින් නිෂ්පාදන ධාරිතාව පහත වැටීම, ශ්‍රම වැය ඉහළ නැගීම, කාර්‍ය කෞශල්‍යය හා අත්දැකීම් නැතිවීම හරහා ව්‍යාපාරික ආයතනවලට නොමනා බලපෑමක් ඇති කරයි. ඒ හරුන විට HIV හා AIDS සමග ජීවත්වන හා එහි බලපෑමට ලක්වී ඇති අයවලුන් කොන් කිරීම හා වෙන් කොට සැලකීමට ලක් කෙරෙන නිසා, සත්‍ය හෝ හෝ අනුමාන කරණ HIV තත්ත්වය මත ශ්‍රමිකයන්ගේ මූලික අයිතිවාසිකම් බොහෝ විට උල්ලංඝනය වේ. තත්ත්වය වඩාත් බරපතල වන්නේ, සමාජීය විභේද රේඛාවන් ඔස්සේ, එනම් දැනටමත් අවාසි සහගත තත්ත්වයන්ට හා ආංශික බවට පත්ව ඇති ප්‍රජා කොටස් ඔස්සේ මෙම වසංගත තත්ත්වය සංචලනය වීමට තිබෙන ප්‍රවනතාවයි.

HIV සහ AIDS ගැටලුව ඇමතීමට තීරණාත්මක භූමිකාවක් වැඩ ලෝකය විසින් රඟපානු ලබයි. වැඩබිම, එනම් ඔවුන්ගේ ජීවිතවල වැඩි කාලය ගතකරන ස්ථානය, ස්ත්‍රී පුරුෂ ශ්‍රමිකයන් වෙත ලඟා වීමට වටිනා අවතීර්ණ ස්ථානයක් සපයයි. සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වලටත්, ඔවුන්ගෙන් යැපෙන්නන්ටත් වැළැක්වීම, ප්‍රතිකාර, උවටැන් හා සහය සේවා වෙත ළඟාවීමට අවශ්‍ය පහසුකම් සේවා ස්ථානවල ප්‍රතිපත්ති හා වැඩසටහන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම නිසා ලැබේ. මේ අනුසාරයෙන් පුලුල් ප්‍රජාව වෙත ළඟාවීමට ද හැකි ය. එ සේ වුව ද, වැඩ ලෝකය විසින් වසංගතය පාලනය සඳහා ගනු ලබන උත්සාහය ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගෙන නැත. වසංගතය ඇමතීම සඳහා එහි මුීට දායකත්වය ලබා ගැනීමට නම්, ජාතික HIV හා AIDS ප්‍රතිපත්ති, වැඩසටහන් හා ක්‍රමෝපාය වල සමෝධානිත කොටසක් බවට වැඩ ලෝකය පත් කළ යුතු ය.

2001 වසරේ දී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් HIV/AIDS සහ හා වැඩ ලෝකය පිළිබඳ භාවිතයන් සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය සම්මත කර ගන්නා ලදී. එය බොහෝ රටවල පුළුල්ව භාවිතා වේ. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතියක් ගොඩනගා සම්මත කර ගැනීම මගින් HIV සහ AIDS ගැන වැඩ ලෝකයේ ප්‍රතිචාරය වෙනස් මට්ටමකට නැංවීමට කාලය පැමිණි ඇති බව 2007 වසරේ දී සංවිධානයට සම්බන්ධ රටවල් තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සැකසුන අංක 200 නිර්දේශ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමාජික රටවල හා සේව්‍ය සේවක නියෝජිතයන්ගේ ඉතා පැහැදිලි කැපවීම ගොනු වී ඇත. මෙයට, HIV සමග ජීවත්වන පුද්ගලයන්ගේ සංවිධාන සහ ජාත්‍යන්තර හවුල්කාර සංවිධාන විශේෂයෙන් UNAIDS සහභාගීත්වය ලබා ගත්තේ වැළැක්වීම, ප්‍රතිකාරය, උවටැන් හා සහාය සඳහා වැඩ ලෝකය තුළින් ලබා දිය හැකි ඉමහත් දායකත්වය සහතික වශයෙන් සපයා ගැනීම සඳහා ය.

වැඩබිම තුල වැළැක්වීමේ ආයාසයන් ප්‍රබල කිරීමේ අවශ්‍යතාවයත්, HIV සහ AIDS සමග ජීවත්වන හා ඉන් පීඩාවට පත් පුද්ගලයන්ට ප්‍රතිකාර ලබා ගැනීම පහසු කිරීමත්, මෙම නිර්දේශ තුලින් පිළිඹිඹු වෙයි. ජාතික ත්‍රෛපාර්ශවීය වැඩබිම ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත්, ඒවා සමස්ත ජාතික ප්‍රතිපත්ති හා ක්‍රමෝපයයන්ට සමෝධානය කිරීමත් එමගින් ඉල්ලා සිටී. එසේම පුරුෂ සමානාත්මතාවය පිළිබඳ මූලධර්මය, අනිවාර්‍ය ලෙස රෝග පරීක්‍ෂණයට භාජනයවීමෙන් හා HIV පිළිබඳ තත්ත්වය හෙළිදරව් කිරීමෙන් නිදහස් වීමේ අයිතිය, සෑම දෙනෙකුම හැකි ඉක්මණින් හා රහස්‍ය ස්වේච්ඡා උපදේශනය ලබා ගැනීමට හා පරීක්‍ෂණයට භාජනය වීමට උනන්දු කරවීම යන කරුණු ඇතුළත්ව සියලුම සේවකයන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් වලට ගරු කිරීම මෙයින් අපේක්‍ෂා කෙරේ. අවශ්‍ය ආකාරයට ජාතික ව්‍යවස්ථාවන් සංශෝධනය හෝ සම්මත කර ගැනීම මගින් නිරේදශයන් ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික රටවලින් ඉල්ලා සිටී.

සත්‍ය හෝ අනුමාන කරන ලද HIV තත්ත්වය මත ශ්‍රමිකයන් කොන් කිරීම හා වෙනස් ලෙස සැලකීමක් නැති විට, ජාතික මට්ටමේ දී මෙන්ම වැඩබිම් මට්ටමේ දී සැපයෙන අධ්‍යාපනය, තොරතුරු, ප්‍රතිකාර, උවටැන් හා සහය සේවා ලබා ගැනීමේ අවහිරකම් ඉවත් ව, ශ්‍රමිකයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට ඉන් වඩාත් ප්‍රයෝජන ලැබීමට හැකිවෙයි.

නිර්දේශ හා ඊට අනුගාමී යෝජනා පදනම් කර ගෙන ශ්‍රමිකයන්ගේ හා HIV සහ AIDS සමග ජීවත්වන හා ඉන් පීඩාවට පත්ව සිටින සියල්ලන්ගේ අයිතිවාසිකම් හා අභිමානය ආරක්‍ෂා කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර හා ජාතික වශයෙන් සහයෝගය දීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය කැපවෙයි.

ජිනීවා, 2010 ජූනි

ජුවාන් සොමාවියා
අධ්‍යක්‍ෂ ජනරාල්

# ජාත්‍යන්තර කම්කරු සම්මේලනය

## 200 වන නිර්දේශය

# HIV/AIDS සහ වැඩ ලෝකය සැලකිල්ලට ගනිමින් කෙරෙන නිර්දේශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මහා සම්මේලනය,

ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ පාලන මණ්ඩලය විසින් කැඳවනු ලබන්නට යෙදුන, සහ 2010 ජූනි 2 දින ජිනීවා හි දී පවත්වනු ලැබූ 99 වැනි සැසිවාරයේ දී, හමුවූ සහ,

HIV සහ AIDS සමාජය හා ආර්ථිකයන් කෙරෙහි ද, විධිමත් හා අවිධිමත් යන අංශ දෙකෙහිම වැඩ ලෝකය කෙරෙහි ද, ශ්‍රමිකයන්, ඔවුන්ගේ පවුල් හා යැපෙන්නන් කෙරෙහි ද, සේව්‍ය හා සේවක සංවිධාන කෙරෙහි ද, රාජ්‍ය හා පුද්ගලික ව්‍යවසායන් කෙරෙහි ද, සුනිසි මෙහෙවර හා යාදෙන සංවර්ධනය ගොඩනැංවීම කෙරෙහි ද, බරපතල ගැම්මක් ඇති කරන බව සැලකිල්ලට ගෙන, සහ

වැඩලෝකය තුල HIV සහ AIDS සම්බන්ධව ක්‍රියාකිරීමේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ භූමිකාවෙහි වැදගත්කම ද, එහි ක්‍රියාකාරිත්වයේ සෑම අංශයකම හා එහි විධිනියෝගයට අනුකූලව කොන් කිරීම හා වෙනස් ලෙස සැලකීමට එරෙහි වීමට ද, සමාජ සාධාරණත්වය ඇති කිරීම සඳහා සිය වෑයම ශක්තිමත් කිරීමට සංවිධානයට ඇති අවශ්‍යතාවය ද, නැවත සහතික කරමින්, සහ

HIV සහ AIDS වලට ප්‍රතිචාර දැක්වීම් වශයෙන් වැඩලෝකය හොඳින් සංචලනය කිරීම සඳහා සුනිසි මෙහෙවර හා යාදෙන සංවර්ධනය ගොඩනගා අවිධිමත් ආර්ථිකය පහත හෙළීමේ වැදගත් කම මෙනෙහි කරමින්, සහ

සමාජ හා ආර්ථික අසමානකම් ඉහළ මට්ටමක පැවතීම ද, තොරතුරු හා දැනුවත්භාවය අඩු කම ද, රහස්‍යභාවය නොරැකීම හා ප්‍රතිකාර ලබා ගැනීමේ හැකිකම අඩුවීම හා නොකඩවා ප්‍රතිකාර ගැනීමේ අඩුකම ද, HIV පැතිරීමේ අවදනම හා මරණයට පත්වීමේ ප්‍රවණතාව ඉහළ යාම ද, තම මාපියන්ගෙන් කෙනෙකු හෝ දෙදෙනාම මියගිය ළමුන් සංඛ්‍යාව ද, අවිධිමත් අංශයේ සේවයේ යෙදෙන ශ්‍රමිකයන් සංඛ්‍යාව ද, සැලකිල්ලට ගනිමින්, සහ

දිළිඳු බව, සමාජ ආර්ථික අසමානතාව සහ සේවා වියුක්තිය නිසා වැළැක්වීම, ප්‍රතිකාරය, උවටැන් සහ සහය පහසුකම් නොලැබ යාමේ අවදානම ඉහළ යාම ද, ඒනිසා පැතිරීමේ අවදානම ඉහළ යාමද සැලකිල්ලට ගනිමින්, සහ

HIV සහ AIDS වලින් පෙලීම නිසා කොන් කිරීම, වෙනස් ලෙස සැලකීම, හා රැකියා අහිමිවීම හේතුවෙන් යමෙකු ගේ HIV තත්ත්වය දැන ගැනීමට බාධාකාරී බව ද, ඒ අනුව ශ්‍රමිකයන් HIV ආසාදනය කෙරෙහි වැඩි අවදානමකට පත් වෙනවා

මෙන්ම සමාජීය ප්‍රතිලාභ සඳහා ඔවුන්ගේ අයිතිය නො සලකා හරින බව ද සැලකිල්ලට ගනිමින්, සහ

අවදානමට පත් වීමට ඉඩ ඇති සහ අවදානමේ සිටින කණ්ඩායම්වලට HIV සහ AIDS නිසා වඩා උග්‍ර බලපෑමක් ඇති වන බව ද සැලකිල්ලට ගනිමින්, සහ

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම HIV ආසාදනය බලපාන බව ද, එ නමුත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අසමානකම් හා කාන්තා බලසතුවීමේ අඩු ලුහුඬුකම් හේතුවෙන් පුරුෂයන් හා සසඳන විට කාන්තාවන් හා ගැහැණු ළමුන් HIV ආසාදනයට යොමු වීමේ අවදානම අධික මෙන් ම ලොව පුරා HIV වසංගතය අසමාන අනුපාතයකින් බලපාන බව ද, ඒ නිසා HIV සහ AIDS කෙරෙහි ගෝලීය ප්‍රතිචාරයේ දී කාන්තාවන් බලසතු කිරීම මුඛ්‍ය සාධකයක් බව ද සැලකිල්ලට ගනිමින්, සහ

විස්තරාත්මක වෘත්තීය ආරක්ෂා සහ සෞඛ්‍ය වැඩ සටහන් මගින් ශ්‍රමිකයන් ආරක්ෂා කිරිමෙහි වැදගත්කම මෙනෙහි කරමින්, සහ

HIV/AIDS සහ හා වැඩ ලෝකය පිළිබඳ භාවිතයන් සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අගය සහ එය ක්‍රියාවට නැංවීමේ දී තිබෙන සීමා සහ හිදැස් ගැන අවධානය යොමු කර, එහි ගැම්ම ප්‍රබල කිරීමේ අවශ්‍යතාවය මෙනෙහි කරමින්, සහ

HIV සහ AIDS හා වැඩ ලෝකය සම්බන්ධ ජාත්‍යන්තර කම්කරු සම්මුතීන්, නිර්දේශ හා ළඟා කර ගත හැකි ඉහළම සෞඛ්‍ය ප්‍රමිතීන් සහ සුනිසි ජීවන මට්ටම් වල ද අයිතිය පිළිගන්නා උපකරණ ඇතුලු HIV සහ AIDS හා වැඩ ලෝකයට අදාල වෙනත් ජාත්‍යන්තර උපකරණ ප්‍රවර්ධනය කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනිමින්, සහ

වැඩ ලෝකය ඇතුලත හා ඒ හරහා HIV සහ AIDS ප්‍රතිචාරය සඳහා ජාත්‍යන්තර හා දේශීය වැයම් ප්‍රවර්ධනය කිරීම හා සහයෝගය දැක්වීම වෙනුවෙන් සේව්‍ය සේවක සංවිධානවල විශේෂිත භූමිකාව මෙනෙහි කරමින්, සහ

HIV සහ AIDS කෙරෙහි ජාතික ප්‍රතිචාරයට අදාල වැළැක්වීම, ප්‍රතිකාර, උවටැන් හා සහාය පිළිබඳ ප්‍රතිචාරයට අදාල තොරතුරු සහ සේවා ලබා ගැනීම සම්බන්ධව වැඩබිම් වල භූමිකාවේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සහ

මෙම නිර්දේශයන් ක්‍රියාවට නැංවීමේ වැයම ඉහළ නැංවීම සහ දිගටම පවත්වා ගෙනයාම ට සහයෝගය දැක්වීම සඳහා විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහනෙහි සහ ජාත්‍යන්තර සහයෝගයෙහි අවශ්‍යතාව තහවුරු කරමින්, සහ

විශේෂයෙන් HIV සමග ජීවත්වන පුද්ගලයන් නියෝජනය කරන සංවිධාන ද සමග සෞඛ්‍ය අංශය සහ අදාල සංවිධාන ඇතුලු ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටම්වල ක්‍රියාත්මක HIV සහ AIDS සමග කටයුතු කරන ව්‍යුහයන් සමග සහයෝගීතාවය ගොඩනගා ගැනීමේ වටිනාකම මෙනෙහි කරමින්, සහ

සියලුම මට්ටම් වල දී සිය භූමිකා හා වගකීම් අර්ථ දක්වමින් රාජ්‍යයන් හා සේව්‍ය සේවක සංවිධාන වලට මග පෙන්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියක් සැකසීමේ අවශ්‍යතාව තහවුරු කරමින්,

HIV සහ AIDS හා වැඩ ලෝකය ට අදාල සමහර යෝජනා පිළිගැනීමට තීරණය කරමින්, සහ

මෙම යෝජනා නිර්දේශ බවට පත් කිරීමට තීරණය කරමින්,

දෙදහස් දහය වසරේ ජූනි දහහත්වන දින පහත සඳහන් නිර්දේශය HIV සහ AIDS නිර්දේශය (2010) ලෙස සම්මත කර ගන්නට යෙදුනි.

## I. අර්ථ දැක්වීම

1. මෙම නිර්දේශයන්ගේ අවශ්‍යතාව සඳහා;

(අ) "HIV" වනාහි මානව ප්‍රතිශක්ති ඌණතා වෛරසය, එනම්, ප්‍රතිශක්ති පද්ධතියට හානි කරන වෛරසය කි. උචිත පියවරයන් මගින් ආසාදනය වැළැක්විය හැක;

(ආ) "AIDS" වනාහි නතුකරගත් HIV ආසාදනයේ උච්චතම අවස්ථාවක් වන මෙය ප්‍රතිශක්ති ඌණතා සහලක්ෂණය යි. ඒ ඒ අවස්ථාවට අනුව ඇතිවන ආසාදන හෝ HIV සම්බන්ධ පිළිකා හෝ මේ දෙක්ම රෝග ලක්ෂණ පෙන්නුම් කෙරේ;

(ඇ) "HIV" සමග ජීවත්වන පුද්ගලයන්' යනු HIV අසාදනයට ලක්වූ පුද්ගලයන් වේ;

(ඈ) "කොන්කිරීම" (හෙවත් අපකීර්තිය) වනාහි සමාජීය වශයෙන් නිවරණ යෙදීමකී.

පුද්ගලයෙකු කොන් කිරීමට ලක් වූ විට සමාන්‍යයෙන් පසෙකට කර දැමීමක් (ආන්තිකභාවයට ලක්කිරීමක්) සිදුවීම හෝ HIV අසාදිත හෝ ඒ නිසා පීඩාවට පත්වූ පුද්ගලයාට පූර්ණ වශයෙන් සාමාජයීය ජීවිතයක් ගත කිරීමට බාධා පැමිණීම සිදු වේ;

(ඉ) "වෙනස් කොට සැලකීම" (හෙවත් පරිහාරය) යනු මොන ආකාරයේ හෝ වෙනම හඳුනා ගැනීමක් බැහැර කිරීමක් හෝ අභිමතයක් වෙයි. වෙනස් කොට සැලකීම (රැකියා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතිය (1958) හා එම නිර්දේශ (1958) වල සඳහන් පරිදි මේ නිසා රැකියාවේ හෝ වෘත්තියේ සමාන අවස්ථා ලැබීමේ හෝ සමානව සැලකීමේ අවස්ථාවන්ට හානි පැමිණවීම හෝ එම අවස්ථා නැතිවීම සිදු වේ;

(ඊ) "පීඩාවට පත්වූ පුද්ගලයන්" වනාහි වසංගතය විසින් ඇති කරන පුලුල් බලපෑම නිසා HIV හෝ AIDS හේතුකොට ගෙන සිය ජීවිතවල වෙනසක් ඇති වූවන් ය;

(උ) "යුක්ති යුක්ත උපකාරය" වනාහි HIV හෝ AIDS සහිතව ජීවත්වන පුද්ගලයකුට රැකියා අවස්ථා ලබාගැනීමට, රැකියාවේ යෙදීමට හෝ එහි ඉහළට යාමට හැකිවන සේ යුක්ති යුක්ත වූ මොනම ආකාරයක හෝ ප්‍රායෝගික සංශෝධනයක් නැතිනම් සකස් කිරීමකි;

(ඌ) "අවදානමට ඉඩ ඇති බව" වනාහි සමාජීය, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික සාධක හේතුවෙන් පුද්ගලයෙකු HIV ආසාදනයට වඩාත් නැඹුරු කරවන

අසමාන රැකියා අවස්ථා, සමාජීය වශයෙන් බැහැර කිරීම, සේවා වියුක්තිය හෝ අඩමාන සේවා නියුක්තිය යි;

(එ) "වැඩබිම" වනාහි ශ්‍රමිකයන් සිය කාර්‍යයන්ට සහභාගිවන මොනයම්ම හෝ ස්ථානයක් වේ; සහ

(ඒ) "ශ්‍රමිකයා" යනු යම් ආකාරයකට හෝ විධිවිධානයකට අනුව වැඩෙහි යෙදෙන කවුරුන් හෝ පුද්ගලයන්ය.

## II. විෂය පථය

2. මෙම නිර්දේශයෙන් ආවරණය කරන්නේ:

(අ) සැම වැඩබිමකම යම් අකාරයකට හෝ විධිවිධානයකට අනුව පහත සඳහන් කාණ්ඩයන් ඇතුලත්වන ශ්‍රමිකයෝ ය:

i. මොනම හෝ රැකියාවක හෝ වෘත්තියක නියැලෙන පුද්ගලයන්;

ii. සීමාවාසිකයන් හා ශිෂ්‍ය ශිල්පීන් ඇතුලු පුහුණු වෙමින් සිටින්නවුන්;

iii. ස්වේච්ඡා සේවකයන්;

iv. රැකියා සොයන්නවුන් හා රැකියා අයදුම්කරුවන්; සහ

v. සේවයෙන් ඉවත් කළ හා තාවකාලිකව සේවය නැවැත් වූ සේවකයන්;

(ආ) පුද්ගලික හා රාජ්‍ය අංශ, විධිමත් හා අවිධිමත් ආර්ථිකයන්, ඇතුලු ආර්ථික ක්‍රියාකාරිත්වයේ සියලුම අංශ; සහ

(ඇ) සන්නද්ධ හමුදා සහ නිල ඇඳුමින් සැරසුන සේවාවන්.

## III. පොදු මූලධර්ම

3. වැඩලෝකය තුල HIV සහ AIDS සම්බන්ධ ජාතික ප්‍රතිචාරයට ගැබ්වෙන සියලුම ක්‍රියාකාරකම් වලට පහත සඳහන් පොදු මූලධර්ම අදාල විය යුතු ය:

(අ) HIV සහ AIDS ප්‍රතිචාරය ශ්‍රමිකයන් ඔවුන්ගේ පවුල් හා ඔවුන්ගෙන් යැපෙන්නන් ඇතුලු සියල්ලන්ටම මානව අයිතිවාසිකම් හා මූලික නිදහස සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට දායකවන බව පිළිගත යුතු ය;

(ආ) HIV සහ AIDS වැඩබිම්වලට අදාල විෂයයක් බව පිළිගෙන සහ සැලකිල්ලට ගෙන එය සේව්‍ය හා සේවක සංවිධානවල පූර්ණ සහභාගීත්වය ඇතිව වසංගතයට එරෙහි ජාතික, කාලාපීය හා ජාත්‍යන්තර ප්‍රතිචාරයන් හි අත්‍යාවශ්‍ය අංගයක් ලෙස එය අඩංගු කළ යුතු ය;

(ඇ) HIV ආසාදනයේ අවදානමට බොහෝ ඉඩ ඇති හෝ වැඩි අවදානමක සිටින ප්‍රජාවක කොටසකට හෝ ලෝකයේ එවැනි කලාපයකට අයිති වීම මත

ශ්‍රමිකයින්, විශේෂ වශයෙන් රැකියා සොයන්නන් හා රැකියා අපේක්ෂිතයන් කොන් කිරීමකට හෝ වෙනස් කොට සැලකීමටකට ලක් නො විය යුතු ය;

(ඈ) HIV පැතිරෙන සියලුම මාර්ගයන් වැළැක්වීම මූලික ප්‍රමුඛ තාවයකි;

(ඉ) ශ්‍රමිකයන්, ඔවුන්ගේ පවුල් හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට වැළැක්වීම, ප්‍රතිකාර, උවටැන් හා සහාය ලබා ගැනීමටත්, ප්‍රවේශ වීමටත්, ඉන් ප්‍රයෝජන ලැබීමටත් හැකිවිය යුතුවාක් මෙන්ම මෙම සේවාවන්ට ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සැපයීමට සේවා ස්ථානය කටයුතු කළ යුතු අතර සේවාවන් ලබා ගැනීම පහසු කිරීමට දායක විය යුතු ය;

(ඊ) ජාතික මට්ටමේ සහ වැඩබිම් මට්ටමේ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීමට ශ්‍රමිකයන්ගේ සහභාගීත්වය හා එම කටයුතුවල ක්‍රියාකාරීවීම පිළිගැනීම හා වැර ගැන්වීම සිදු විය යුතු ය;

(උ) වෘත්තීය තත්ත්වයන් නිසා HIV බෝ වීම සහ ක්ෂය රෝගය වැනි බෝ විය හැකි රෝග වලින් ඇතිවිය හැකි විශේෂිත අවදානම වැළැක්වීමේ වැඩසටහන් වලින් ශ්‍රමිකයන් ප්‍රතිලාභ ලැබිය යුතු ය;

(ඌ) ශ්‍රමිකයන්ට, ඔවුන්ගේ පවුල් වලට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට - විශේෂයෙන් තමාගේම HIV තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, HIV සහ AIDS වලට සම්බන්ධ රහස්‍යතාවය ඇතුලු තම පුද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමේ අයිතිය භුක්ති විඳිමේ අවස්ථාව තිබිය යුතු ය;

(එ) HIVආසාදනය ඇත්දැයි සෙවීමට පරීක්ෂණයක් කිරීම හෝ සිය HIV තත්ත්වය අනාවරණය කිරීම කිසිම සේවකයෙකුගෙන් ඉල්ලා නො සිටිය යුතු ය;

(ඒ) කම්කරු, අධ්‍යාපන, සමාජ ආරක්ෂණ හා සෞඛ්‍ය අංශ වලට සම්බන්ධ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් වල කොටසක් ලෙස, වැඩ ලෝකය තුල HIV සහ AIIDS ආමන්ත්‍රණය කිරීමේ පියවරයන් ඇතුලත් විය යුතු ය; සහ

(ඔ) විශේෂයෙන් HIV බෝවීමේ අවදානමට අනාවරණය වන වෘත්තීන්හී යෙදෙන්නන් ආරක්ෂා කිරීම.

## IV. ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන්

4. සමාජිකයන් විසින්;

(අ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පහසුකම් නො පවතින තැන්වල ස්ථාපිත කිරීම සඳහා HIV සහ AIDS හා වැඩ ලෝකය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්මත කර ගත යුතු ය;

(ආ) සුනිසි මෙහෙවර, යා දෙන ව්‍යවසායන් සහ ආදායම් උත්පාදන ක්‍රමෝපයයන් ඇතුලු සංවර්ධන සැලසුම් හා දිළිඳුකම අඩු කිරීමේ ක්‍රමෝපායයන්ට HIV සහ AIDS සම්බන්ධ ප්‍රතිපත්ති හා වැඩසටහන් සමෝධානය කළ යුතු ය.

5. ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් ගොඩනැගීමේ දී, HIV/AIDS සහ හා වැඩ ලෝකය පිළිබඳ භාවිතයන් සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය (2001) හා පසුව ප්‍රකාශයට පත්වුන එහි සංස්කරණයන්, වෙනත් අදාල ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙවලම් සහ මෙම විෂයය සම්බන්ධව සම්මත කරගත් ජාත්‍යන්තර මග පෙන්වීම් භාවිතය ගැන නිසි බලධාරීන් සැලකිලිමත් විය යුතු ය.

6. වඩාත් නියෝජනයක් සහිත සේවකයන් ගේ සහ සේව්‍යයන්ගේ සංවිධාන වල, එමෙන්ම HIV සමග ජීවත්වන පුද්ගලයන් නියෝජනය වන සංවිධානයන් හි උපදෙස් පතමින් හා විශේෂයෙන් සෞඛ්‍ය අංශය ආදී අදාල අංශයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් නිසි බලධාරීන් විසින් ජාතික ප්‍රතිපත්ති හා වැඩ සටහන් සැකසිය යුතු ය.

7. ජාතික ප්‍රතිපත්ති හා වැඩ සටහන් සැකසීමේදී, ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහභාගිත්වය ඇතිව ස්වේච්ඡා උපදේශනය හා රෝග පරීක්ෂාව ප්‍රවර්ධනය ඇතුලුව වැළැක්වීම, ප්‍රතිකාරය, උවටැන් සහ සහාය සම්බන්ධව වැඩ බිමෙහි කාර්‍යභාරය නිසි බලධාරීන් විසින් සැලකිල්ලට ගත යුතු ය.

8. හැකි සෑම අවස්ථාවේදීම, සාමාජික රටවල් විසින් ඔවුන්ගේ HIV සහ AIDS හා වැඩ ලෝකය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් ගැන තොරතුරු, සේව්‍යයන් ගේ හා සේවකයන් ගේ සංවිධාන, වෙනත් අදාල HIV සහ AIDS සම්බන්ධ ආයතන සහ ප්‍රසිද්ධ මාධ්‍ය නාලිකා හරහා බෙදා හැරිය යුතු ය.

### *වෙනස් ලෙස සැලකීම සහ සම අවස්ථා පැවතීම හා සමසේ සැලකීම ප්‍රවර්ධනය*

9. ආරක්ෂාව සැපයීමේ දී සැබෑ හෝ අනුමාන කළ HIV තත්ත්වය මත කොන් කිරීම හෝ වෙනස් ලෙස සලකනු වැළැක්වීම සඳහා, වෙනස් ලෙස සැලකීම (රැකියා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතියේ (1958) සඳහන් විධිවිධානයන්ට අනුකූල ලෙස මෙන්ම, වඩාත් නියෝජනය වන සේව්‍යන්ගේ හා සේවකයන්ගේ සංවිධාන වෙතින් උපදෙස් ලබා ගනිමින් රජයයන් විසින් කටයුතු කළ යුතු ය.

10. වෙනස් ලෙස සැලකීම (රැකියා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතියේ (1958) සඳහන් විධිවිධානයන්ට අනුරූප වන අයුරු සබෑ හෝ අනුමාන කළ HIV තත්ත්වය මත වෙනස් ලෙස සලකමින්, සේවයට බඳවා ගැනීම, දිගටම සේවයේ රඳවා ගැනීම හෝ සම අවස්ථා සෙවීම වැළැක්වීමට හේතුවක් කර නො ගත යුතු ය.

11. සැබෑ හෝ අනුමාන කළ HIV තත්ත්වය සේවා නියුක්තිය හමාර කිරීමට හේතුවක් කර නො ගත යුතු ය. සේවා නියුක්තිය හමාර කිරීමේ සම්මුතිය (1982) සැලකිල්ලට ගනිමින් HIV සහ AIDS හේතුවෙන් රෝගී වීම නිසා හෝ HIV සහ AIDS වලට සම්බන්ධ උවටැන් සඳහා තාවකාලිකව රැකියාවට නො පැමිණීම ගැන සැලකිය යුත්තේ වෙනත් රෝගයක් හේතු කොට ගෙන සේවයට වාර්තා නො කරන අවස්ථා වල දී මෙනි.

12. HIV සහ AIDS නිසා වෙනස් ලෙස සැලකීම සාර්ථකව වැළැක්වීමට පවත්නා ක්‍රියාමාර්ග නො සෑහෙන විට දී සාමාජික රටවල් ඒ සඳහා ක්‍රියාමාර්ග සම්මත කරගත යුතු ය. එසේ නැතහොත් නව පියවරයන් ගත යුතු ය. එසේම එම ක්‍රියාමාර්ග ඵලදායීව හා විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාවට නැගිය යුතු ය.

13. HIV හා සම්බන්ධ රෝගී තත්ත්වයන් ඇති පුද්ගලයින් තම සේවයෙහි යෙදීමට වෛද්‍යමය වශයෙන් සුදුසු තාක් කල් එසේ සේවයේ යොදා ගැනීම ප්‍රතික්ෂේප නො කර, අවශ්‍ය නම් යුක්ති යුක්ත උපකාරය ලබා දී සේවයේ යොදවා ගත යුතු ය. ඔවුන්ගේ හැකි කමේ ප්‍රමාණයට වැඩ කිරීමට උචිත තැනකට යෙදවීම, පුහුණුවකින් පසු වෙනත් සේවා අවස්ථා සොයා දීමට පියවර ගැනීම, නැවත සේවයට පැමිණීම යන කරුණු ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහ එක්සත් ජාතීන් ගේ අදාල මෙවලම් සැලකිල්ලට ගනිමින් උනන්දු කළ යුතු ය.

14. HIV පැතිරීම හා ඉන් ඇතිවන බලපෑම අඩු කිරීමට වැඩබිම තුල හෝ ඒ හරහා පහත සඳහන් පියවරයන් ගත හැකි ය:

(අ) මානව හිමිකම් වලට හා මූලික නිදහසට ගරු කිරීමට වග බලා ගැනීම;

(ආ) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තාවන් බලසතු කිරීම සම්බන්ධයෙන් වග බලා ගැනීම;

(ඇ) වැඩබිම තුල ප්‍රචණ්ඩත්වය හා හිංසනය වැළැක්වීමට හා තහනම් කිරීමට කටයුතු යෙදීම;

(ඈ) HIV සහ AIDS තත්ත්වයන් ට එරෙහි ප්‍රතිචාරය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම සක්‍රීය සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) ඔවුන් ගේ ලිංගික මනාපකම් පිළිබඳව හෝ ඔවුන් අවදානමකට ලක්විය හැකි කංඩායමකට අයිතිදැයි යන්න පිළිබඳව සැලැකිල්ලට නො ගෙන සේවකයන්ව බලසතු කිරීම හා සේවයෙහි යොදවා ගැනීම ප්‍රවර්ධනය;

(ඊ) ස්ත්‍රීන් ගේ හා පුරුෂයන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය, ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම ප්‍රවර්ධනය; සහ

(උ) වෛද්‍ය දත්තයන් ඇතුලු පුද්ගලික දත්තයන් පිළිබඳ රහස්‍යභාවය රැකීම.

*වැළැක්වීම*

15. වැළැක්වීමේ ක්‍රමෝපයයන් ජාතික පරිසරයට හා වැඩබිමේ වර්ගයට අනුව අනුවර්තනය කළ යුතු අතර, එහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ආර්ථික කාර්යයන් සැලකිල්ලට ගත යුතු ය.

16. වැළැක්වීමේ වැඩසටහන් වල දී පහත සඳහන් දේ ගැන වග බලා ගත යුතු ය:

(අ) භාවිතාවේ තිබෙන විවිධ සන්නිවේදන නාලිකා මාර්ගයෙන් සංස්කෘතික වශයෙන් සංවේදී අකෘතියකට හා භාෂා විලාශයකට අනුව සියල්ලන්ට ලබාගත හැකි හා

ප්‍රවේශ විය හැකි නිවැරදි, යාවත්කාලීන, අදාල හා වේලාවට ගැලපෙන තොරතුරු ප්‍රකාශයට පත් කිරීම;

(ආ) මවගෙන් දරුවාට ආසාදනය පැතිරීම ඇතුලු සියලු ආකාරයේ ආසාදනය පැතිරීමේ මාර්ග නිසා ඇතිවන අවදානම හා ආසාදනයට සම්බන්ධ අවදානම් චර්යාවන් වෙනස් කිරීමේ වැදගත්කම වටහා ගැනීම අරමුණු කර ගත් ස්ත්‍රී හා පුරුෂයන්ට ප්‍රයෝජනවත් විස්තරාත්මක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම;

(ඇ) ඵලදායි වෘත්තීය ආරක්ෂා සහ සෞඛ්‍ය ක්‍රියාමාර්ග ගැනීම;

(ඈ) ස්වේච්ඡා උපදේශනය හා රෝග පරීක්ෂාව මගින් සිය රෝග තත්ත්වය දැන ගැනීම සඳහා ශ්‍රමිකයන් උනන්දු කරවීමේ ක්‍රියාමාර්ග ගැනීම;

(ඉ) විශේෂිත වශයෙන් ස්ත්‍රී පුරුෂ කොන්ඩම් අවශ්‍ය තොග සැපයීම ඇතුලු, නමුත් ඊටම සීමා නො වූ වැළැක්වීමේ සියලු ක්‍රියාමාර්ග පරිශීලනයට හැකි වීම හා සුදුසු අවස්ථා වල දී ඒවා නිවැරදිව භාවිතා කරන අයුරු කියා දීම හා ලිංගික අනාවරණයකින් පසුව ගැනීමට අවශ්‍ය ඖෂධ තිබීම;

(ඊ) HIV ආසාදනයන් සංඛ්‍යාව අඩු කිරීමේ අපේක්ෂාව සහිතව, දැඩි අවදානමේ සිටින කණ්ඩායම් ද සම්බන්ධ කර ගනිමින් ඉහළ අවදානමක් සහිත ලිංගික චර්යාවන් අඩු කිරීමේ ක්‍රියාමාර්ග;

(උ) ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ප්‍රකාශ කළ මග පෙන්වීම මත පදනම් වූ හානිය අවම කිරීමේ ක්‍රමෝපායයන්, HIV/AIDS සම්බන්ධ එක්සත් ජාතීන් ගේ ඒකාබද්ධ වැඩසටහන (UNAIDS) සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයය (UNODC) සහ වෙනත් අදාල මග පෙන්වීම් පාදක කරගත් හානිය අවම කිරීමේ ක්‍රමෝපායයන්;

*ප්‍රතිකාරය සහ උවටැන*

17. සිය වැඩබිම්වල සෞඛ්‍ය කටයුතු සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් සේව්‍යයන් හා සේවකයන් වෙතින් ද, මහජන සෞඛ්‍යය සේවාවන්ට සම්බන්ධයක් ඇති ඔවුන්ගේ නියෝජිතයන් වෙතින් ද, උපදෙස් ලබා තීන්දු කෙරෙන බවට සාමාජික රටවල් වග බලා ගත යුතු ය.

18. මහජන සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ ක්‍රම හෝ පුද්ගලික රක්ෂණය හෝ වෙනත් යෝජනා ක්‍රම වලින් කුමන එකක් මාර්ගයෙන් හෝ සැපයෙන සෞඛ්‍ය සංරක්ෂණ පහසුකම් වලින් ප්‍රයෝජන ගැනීම සඳහා HIV සමග ජීවත්වන ශ්‍රමිකයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට සම්පූර්ණයෙන් ප්‍රවේශවීමට හැකි බවට සමාජික රටවල් වග බලා ගත යුතු ය.

19. මෙම නිර්දේශය මගින් ආවරණය වන HIV සමග ජීවත්වන ශ්‍රමිකයන්, ඔවුන්ගේ පවුල් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් සියලු දෙනාට සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමේ අයිතිවාසිකම ඇත. නොමිලයේ හෝ දැරිය හැකි මිලකට ලබා ගත හැකි ලෙස මෙම සේවාවන්ට පහත සඳහන් දේ අඩංගු විය හැක:

(අ) ස්වේච්ඡා උපදේශනය හා රෝග පරීක්ෂාව;

(ආ) ප්‍රතිවෛරස විරෝධී ප්‍රතිකාරය සහ ප්‍රතිකාරය නොකඩවා ගැනීම පිළිබඳ අධ්‍යාපනය, තොරතුරු හා සහාය;

(ඇ) ප්‍රතිකාරය හා ගැලපෙන පෝෂණය;

(ඈ) ඒ ඒ අවස්ථාවල පැන නගින ආසාදන වලට හා ලිංගිකව බෝවන රෝග වලට සම්බන්ධ වෙනත් මොනම හෝ රෝග තත්ත්වයකට - විශේෂයෙන් ක්ෂය රෝගයට ප්‍රතිකාර; සහ

(ඉ) HIV සමග ජීවත්වන පුද්ගලයින් වෙනුවෙන් මනෝවිද්‍යාත්මක සහායත් ඇතුලු සහාය සැපයීමේ සහ වැළැක්වීමේ වැඩසටහන්.

20. සෞඛ්‍ය ආරක්ෂාව සහ ආබාධිත වීම, මරණය හා ජීවත්වන්නන් සඳහා ප්‍රතිලාභ ඇතුලු සමාජ ආරක්ෂණ ක්‍රම හා වෘත්තීය රක්ෂණ යෝජනා ක්‍රම හෝ වෙනත් එවැනි යෝජනා ක්‍රම යටතේ සැපයෙන ප්‍රතිලාභ ලැබීම සඳහා ශ්‍රමිකයන් ගේ හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සැබෑ හෝ අනුමාන කළ HIV තත්ත්වය මත වෙන් කොට සැලකීමක් සිදු නො විය යුතු ය.

*සහාය*

21. ජාතික තත්ත්වයන්ට ලැබිය යුතු සැලකිල්ල දෙමින් HIV හෝ HIV සම්බන්ධ රෝග තත්ත්වයක් සමග ජීවත්වන පුද්ගලයන් සඳහා වන උවටැන් හා සහාය වැඩ සටහන් වලට යුක්ති යුක්ත උපකාරය පිළිබඳ ක්‍රියාමාර්ග ද ඇතුළත් විය යුතු ය. HIV සහ AIDS රෝග තත්ත්වයන් හී දී වරින් වර අසනීප වීම මෙන්ම, ප්‍රතිකාරයේ අතුරු ප්‍රතිඵලයන්ට ගැලපෙන පරිදි වැඩෙහි යෙදීම ට කටයුතු සංවිධානය කළ යුතු ය.

22. HIV සමග ජීවත් වන පුද්ගලයන් සිය සේවාවන්හි නවතා ගැනීම සහ සේවයට බඳවා ගැනීම සමාජික රටවල් ප්‍රවර්ධනය කළ යුතු ය. සේවා නියුක්ත මෙන්ම, සේවා වියුක්ත කාල සීමාවන් හි දී HIV සමග ජීවත්වන පුද්ගලයන් ට අවශ්‍ය සහයෝගය ලබාදීම සමාජික රටවල් ප්‍රවර්ධනය කළ යුතු ය. අවශ්‍යතාවය යෙදෙන පරිදි HIV සමග ජීවත්වන හෝ HIV නිසා පීඩාවට පත් පුද්ගලයන්ට ආදායම් උත්පාදන අවස්ථා සපයා දිය යුතු ය.

23. ජාතික ක්‍රියා පිළිවෙත හා අර්ථ දැක්වීම, වෘත්තීය රෝග නිර්දේශයන් ලැයිස්තුව (2002) මෙන්ම අදාල ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙවලම් වලට අනුව යම් වෘත්තියක් සමග ආසාදනයේ අවදානම ගැන සෘජු සම්බන්ධතාවක් පෙනෙන විට, AIDS සහ HIV ආසාදනයට ලක්වීම සැලකිය යුත්තේ වෘත්තීය රෝගයක් හෝ අනතුරක් ලෙස ය.

*පරීක්ෂා කිරීම, පුද්ගලිකත්වය හා රහස්‍යභාවය*

24. රෝග පරීක්ෂාව මොනම හෝ බලකිරීමකින් තොරව සැබෑවටම ස්වේච්ඡාවෙන් සිදුවිය යුතු අතර, රෝග පරීක්ෂා වැඩ සටහන් රහස්‍යභාවය, උපදේශනය හා කැමැත්ත පළ කිරීම සම්බන්ධ ජාත්‍යන්තර මග පෙන්වීම් වලට ගරු කළ යුතු ය.

25. HIV රෝග පරීක්ෂාව හෝ HIV ආසාදනය සඳහා වෙනත් ආකාරයක ආවරණය කිරීම් සංක්‍රමණික ශ්‍රමිකයන්, රැකියා සොයන්නන් හා ලිංගික අයදුම්කරුවන් ද ඇතුලු ශ්‍රමිකයන්ගෙන් ඉල්ලා නො සිටිය යුතු ය.

26. HIV රෝග පරීක්ෂාවේ ප්‍රතිඵල රහස්‍ය ලෙස තබා ගත යුතු අතර, එම ප්‍රතිඵල රැකියාවකට ඇතුලු වීම, එම රැකියාවේ යෙදී සිටිම, රැකියාවේ ආරක්ෂාව හෝ ඉහළ මට්ටමකට යාමේ අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමේ දී බාධාවක් නො විය යුතු ය.

27. සංක්‍රමණික ශ්‍රමිකයන්, රැකියා සොයන්නන්, රැකියා අයදුම්කරුවන් ඇතුලු ශ්‍රමිකයන්ගෙන් සිය රටේ දී, මාර්ගස්ථව සිටින විට එම රටක දී හෝ ගමනාන්ත රටේ දී, ඔවුන් ගේ හෝ සෙස්සන් ගේ HIV රෝග තත්ත්වයට අදාල තොරතුරු එළිදරව් කරන ලෙස ඉල්ලා නො සිටිය යුතු ය. එම තොරතුරු පරිශීලනය ශ්‍රමිකයන් ගේ පුද්ගලික දත්ත වල ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ (1997) හා වෙනත් අදාල ජාත්‍යන්තර දත්ත ආරක්ෂා කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

28. සංක්‍රමණික සේවකයන් හෝ සේවා නියුක්තිය වෙනුවෙන් සංක්‍රමණය වීමට බලාපොරොත්තුවන්නන්ව, සිය රටේ දී, මාර්ගස්ථ රටක දී හෝ ගමනාන්ත රටේ දී ඔවුන්ගේ සැබෑ හෝ අනුමාන කරන ලද HIV තත්ත්වය මත එසේ සංක්‍රමණය වීම වැළැක්විය යුතු නො වේ

29. ඉහත දක්වා ඇති ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වූ විටක දී එයට විසඳුම් ලබා ගැනීම සහතික කරනු පිණිස පහසුවෙන් ලඟාවිය හැකි ආරාවුල් සමථයකට පත්කිරීමේ ක්‍රියා මාර්ග සාමාජික රටවල් විසින් ස්ථාපිත කළ යුතු ය.

## *වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය*

30. වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සම්මුතිය(1981), වෘත්තීය ආරක්ෂව හා සෞඛ්‍ය ප්‍රවර්ධන ව්‍යුහය පිළිබඳ සම්මුතිය (2006) හා එම නිර්දේශය (2006) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඒකාබද්ධව සකස් කර ඇති මග පෙන්වීමේ ලේඛණ ආදී වෙනත් අදාල ජාත්‍යන්තර මෙවලම් සැලකිල්ලට ගනිමින්, වැඩබිම තුල දී HIV බෝ වීම වැළැක්වීමට සුදුසු පරිදි වැඩ කිරීමේ පරිසරය ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්නව පැවැත්විය යුතු ය.

31. සෞඛ්‍ය අංශය වැනි විශේෂයෙන් දැඩි අවදානමක් සහිත සේවාවන්හි සේවයෙහි යෙදෙන විට, සේවකයන් HIV ආසාදනයට අනාවරණය වීමෙන් වැළැක්වීම සඳහා ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ ක්‍රියාමාර්ග වලට ලොව පුරා භාවිතා වන පූර්වාරක්ෂාව, අනතුරු හා ආපදාව වැළැක්වීම සඳහා වූ පියවරයන්, ඉංජිනේරු වැඩ පරිචය පිළිබඳ පාලනය, පුද්ගල ආරක්ෂණ උපකරණ, එසේ කිරීම උචිත ලෙස පෙනෙන විට, පරිසරය පාලන ක්‍රියාමාර්ග සහ අනාවරණයෙන් පසු නිවාරණ කටයුතු සහ HIV හා ක්ෂය රෝගය වැනි ආසාදනයන් පැතිරීමේ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය වෙනත් ආරක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතු ය.

32. සේවයෙහි යෙදෙන අතරතුර HIV ආසාදනයට අනාවරණය වීමේ හැකි කමක් තිබෙන විට, එම ශ්‍රමිකයන් ආසාදනය පැතිරෙන අන්දම, එයට අනාවරණය වීම හා ආසාදනය වීම වැළැක්වීමේ ක්‍රියාමාර්ග සම්බන්ධව අධ්‍යාපනය හා පුහුණුව ලැබිය යුතු ය. අදාල ප්‍රමිතීන්ට අනුකූලව වැළැක්වීම, ආරක්ෂාව හා සෞඛ්‍ය පහසුකම් සැපයීමේ ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම සාමාජික රටවල් විසින් දැරිය යුතු ය.

33. දැනුවත් භාවය ඇති කිරීමේ ක්‍රියාමාර්ග විසින් HIV ආසාදනය අහම්බෙන් සිදුවන ශරීර ස්පර්ශයක් නිසා සිදු නො වන බව ද, HIV සමග ජීවත්වන පුද්ගලයෙක් වැඩබිමට උපද්‍රවයක් නො වන බවද අවධාරණය කළ යුතු ය.

34. වෘත්තීය සෞඛ්‍ය සේවා සම්මුතිය (1985) සහ එම නිර්දේශයන් (1985), 2005 දී ප්‍රකාශනයට පත් කළ *ලෝක සෞඛ්‍ය සංවිධානය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඒකාබද්ධව සකස් කර ඇති HIV/AIDS මග පෙන්වීම් සහ* මොනයම් හෝ තදන්තර සංස්කරණයන් හා වෙනත් අදාල ජාත්‍යන්තර මෙවලම් සැලකිල්ලට ගනිමින් වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ වෘත්තීය සෞඛ්‍ය සේවා සහ වැඩබිම් යාන්ත්‍රණයන් හරහා HIV සහ AIDS ආමන්ත්‍රණය විය යුතු ය.

### *ළමුන් හා තරුණ පුද්ගලයන්*

35. සේවයෙහි යේදීම පිළිබඳ අවශ්‍ය මූලධර්ම හා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශනය (1998), අවම වයස පිළිබඳ සම්මුතිය (1973) සහ එම නිර්දේශ (1973), නරකම ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ සම්මුතිය (1999) හා එම නිර්දේශ (1999) සැලකිල්ලට ගනිමින් AIDS හේතුකොට ගෙන සිය දෙමව්පිය භාරකාරාදීන් රෝගී වීම හෝ මරණයට පත්වීම හේතුවෙන් සිදුවන ළමා ශ්‍රමය ලබා ගැනීම හා ළමා කුට්ටනය මැඩ පැවැත්වීමටත්, ළමුන් ආසාදනයට යොමුවීමේ අන්තරායකර තත්ත්වය පහළ දැමීමටත් සාමාජික රටවල් ක්‍රියාමාර්ග ගත යුතු ය.

36. තරුණ ශ්‍රමිකයන් HIV ආසාදනයට ලක්වීම වැළැක්වීමටත්, HIV සහ AIDS වලට එරෙහි ප්‍රතිචාර දැක්වීමේ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට ළමුන්ගේ හා තරුණයන්ගේ විශේෂිත අවශ්‍යතා ඇතුළත් කිරීමටත්, සමාජික රටවල් ක්‍රියාමාර්ග ගත යුතු ය. මෙම ප්‍රතිපත්ති හා වැඩසටහන් අරමුණු වලට ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ඇතුළත් විය යුතු ය. විශේෂයෙන් වෘත්තීය පුහුණු හා තරුණයන් සේවා නියුක්ත කරවීමේ වැඩසටහන් හා සේවාවන් වල දී HIV සහ AIDS සම්බන්ධ තොරතුරු සැපයීමත් ඇතුළත් විය යුතු ය.

## V. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

37. HIV සහ AIDS හා වැඩ ලෝකය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් වල දී:

(අ) අදාල පොදු හා පෞද්ගලික වෘත්තීය සෞඛ්‍ය ව්‍යුහයන් ඇතුලු සේව්‍යයන්ගේ හා සේවකයන්ගේ වඩාත්ම නියෝජනයක් ඇති සංවිධාන හා වෙනත් අදාල

හවුල් කරුවන්ගේන් උපදෙස් පතමින් පහත සඳහන් ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් සංකලනයෙන් ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය:

(i) ජාතික නීති හා රෙගුලාසි;

(ii) සාමුහික එකඟතාවයන්;

(iii) ක්‍රියාකාරී ජාතික සහ වැඩබිම් ප්‍රතිපත්ති හා වැඩසටහන්; සහ

(iv) මෙම නිර්දේශයෙන් ආවරණය වන දැඩි අවදාකමක පසුවන පුද්ගලයන් සහිත අංශයන්ට විශේෂිත අවධානයක් සහිත ආංශික ක්‍රමෝපායයන්;

(ආ) ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු ප්‍රශ්න ගැන ප්‍රවීනත්වයක් ඇති අධිකරණ බලධාරීන් හා කම්කරු පරිපාලන බලධාරීන් යෙදවීම සහ ඔවුන්ට මේ සඳහා පුහුණුවක් සැපයීම;

(ඇ) මෙම නිර්දේශය මගින් සපයනු ලබන පුද්ගලිකත්වය, රහස්‍යභාවය නොරැකීම හා වෙනත් ආරක්ෂාවන් බිඳ දැමීම ගැන කටයුතු කිරීම සඳහා ක්‍රියාමාර්ග ජාතික නීති රීති හා රෙගුලාසි  තුල අඩංගු කිරීම;

(ඈ) රක්ෂණ හා ප්‍රතිලාභ වැඩසටහන් හා වෙනත් එවැනි ආකාරවල සටහන් ඇතුලු අදාල පොදු හා පෞද්ගලික් සේවාවන් සහ රාජ්‍ය බලධාරීන් අතර සහයෝගය හා සම්බන්ධීකරණය තහවුරු කිරීම;

(ඉ) සේව්‍යයන්ගේ හා සේවකයන් ගේ සංවිධාන වල සහභාගීත්වය ඇතිව ඒ ඒ ව්‍යවසායයන් ගේ සැපයුම් ක්‍රමයන් හා බෙදා හැරීමේ ජාලයන් ඇතුලු සියලු ව්‍යවසායන් තුළ ජාතික ප්‍රතිපත්ති හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය හා සහය දීම. එසේම අපනයන සංවර්ධන කලාප තුල ක්‍රියාත්මකවන ව්‍යවසායන් මීට අනුකුලත්වය දැක්වීම තහවුරු විය යුතු ය;

(ඊ) ත්‍රෛපාර්ශ්වික උපදෙස් පැතීම (ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්) පිළිබඳ සම්මුතිය (1976) සහ වෙනත් ආකාර වල රාජ්‍ය බලධාරීන්, පොදු හා පෞද්ගලික සේව්‍යයන් හා පොදු හා පෞද්ගලික සේවකයන් හා ඔවුන්ගේ නියෝජිතයන් සමග වෘත්තීය සෞඛ්‍ය නිලධාරීන්ගේ හා  HIV සහ AIDS පිළිබඳ විශේෂඥයන් ගේ අදහස් ද, HIV සමග ජීවත්වන පුද්ගලයන් නියෝජනය කරන සංවිධාන, ජාත්‍යන්තර සංවිධාන හා අදාල සිවිල් සමාජ සංවිධාන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් කතිකාවතක් ගොඩ නැගීම හා උපදෙස් පැතීම ඇතුලු සමාජ සංවාදයක් ප්‍රවර්ධනය කිරීම;

(උ) ඒ ඒ රටෙහි සම්බන්ධීකරණ යන්ත්‍රණයක් ගොඩ නැගීම, ක්‍රියාත්මක කිරීම, නිතිපතා සමාලෝචනය හා යථාවත් කිරීම. මෙහි දී ඉතා මෑත කාලයේ විද්‍යාත්මක හා සමාජයීය විකාශනයන් ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හා සංස්කෘතිය සම්බන්ධ කරුණු මූල ප්‍රවාහ ගත වීම ද සැලකිල්ලට ගත යුතු ය;

(ඌ) වෙනත් ප්‍රතිපත්ති හා වැඩසටහන් අතර, කම්කරු, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ හා සෞඛ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සමග සම්බන්ධිකරණය වීම; සහ

(එ) ජාතික තත්ත්වයන් ගැන ද, සේවකයන්ගේ හා සේව්‍යයන් ගේ ධාරිතාව ගැන ද තැකීමක් ඇතිව මෙම ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජික රටවල් විසින් සාධාරණ ප්‍රතිපාදන සැපයීම ගැන සහතික විය යුතු ය.

*සමාජ සංවාදය*

38. සිය වැඩබිම් වල HIV සහ AIDS සමග ජීවත්වන පුද්ගලයන් ගේ සක්‍රීය සහභාගීත්වය ඇතිව සේව්‍යයන් ගේ සේවකයන්ගේ හා ඔවුන්ගේ නියෝජියන්ගේත්, රජයේත් සහයෝගය හා විශ්වාසය මත පදනම්ව HIV සහ AIDS සම්බන්ධ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

39. තම සාමාජිකයන් වෙත අධ්‍යාපනය හා තොරතුරු සැපයීම මගින් වැළැක්වීම හා වෙනස් ලෙස නො සැලකීම ඇතුලුව HIV සහ AIDS පිළිබඳ දැනුවත්භාවය සේව්‍යයන්ගේ හා සේවකයන්ගේ සංවිධාන මගින් දියුණු කළ යුතු ය. දැනුවත්භාවය ඇති කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හා සංස්කෘතික කරුණුවලට සංවේදී විය යුතු ය.

*අධ්‍යාපනය, පුහුණුව, තොරතුරු හා උපදෙස් සැපයීම*

40. පුහුණුව, ආරක්ෂණ උපදෙස් හා වැඩබිම තුල HIV සහ AIDS වලට සම්බන්ධ මොනම හෝ අවශ්‍ය මග පෙන්වීමක් සියලුම සේවකයන් සඳහා පැහැදිලි හා ලබාගත හැකි ආකාරයට ඉදිරිපත් කළ යුතු අතර, එහි දී සංක්‍රමණික සේවකයන්, අලුත පැමිණි හෝ අත්දැකීම් අඩු සේවකයන්, තරුණ සේවකයන්, සීමාවාසිකයන් හා ශිෂ්‍ය ශිල්පීන් ඇතුලු පුහුණුවන්නන් විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු ය. පුහුණුව, උපදෙස් දීම හා මග පෙන්වීම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හා සංස්කෘතික කරුණුවලට සංවේදී විය යුතු අතර, සේවක පිරිසට බලපාන අවදානම් සාධක සැලකිල්ලට ගනිමින් ශ්‍රම බලකායේ ගතිලක්ෂණ හා අනුවර්තනය විය යුතු ය.

41. වැඩබිම තුල සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපකාර වනු පිණිස සේව්‍යයන්ට, සේවකයන්ට, කළමනාකරුවන්ට හා සේවකයන් ගේ නියෝජිතයන්ට යාවත්කාලීන විද්‍යාත්මක, සමාජ ආර්ථික තොරතුරු ද, අදාල අකාරයට HIV සහ AIDS සම්බන්ධ අධ්‍යාපනය හා පුහුණුව ද ලැබිය යුතු ය.

42. සීමාවාසිකයන්, පුහුණුවන්නන් හා ස්වේච්ඡා සේවකයන් ඇතුලු සේවකයන්ගේ දැනුවත්භාවය නංවන තොරතුරු ද, ආසාදනය පාලනය කිරීම සඳහා වැඩබිම් තුල සිදුවන අනතුරු හා ප්‍රථමාධාර දීමේ පිළිවෙත් ද අලලා සුදුසු පුහුණුව ලබා දිය යුතු ය. සිය රැකියාවේ ස්වභාවය නිසා මිනිස් රුධිරය, රුධිර නිෂ්පාදන හා වෙනත් ශාරීරික තරල වලට අනාවරණය වීමේ අවදානමට ලක්වන සේවකයන් ආසාදනය වැළැක්වීම, ආසාදනය ලියාපදිංචි කිරීමේ පිළිවෙත් හා අනාවරණයට පසු නිවාරණ ප්‍රතිකාර සම්බන්ධව අතිරේක පුහුණුව ලැබිය යුතු ය.

43. HIV සහ AIDS වලට අදාල වැඩබිම් ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයන් සම්බන්ධව දැනුවත් වීමේත්, උපදෙස් දීමේත් අයිතිය

සේවකයන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට ඇත. ජාතික පරිචයට අනුකූල වැඩබිම් පරීක්ෂණ අවස්ථා වල දී සේවකයන් හා ඔවුන්ගේ නියෝජිතයන් සහභාගී විය යුතු ය.

*පොදු සේවා*

44. HIV සහ AIDS වලට ඇති ප්‍රතිචාරය තුල කම්කරු පරීක්ෂක වරුන් ඇතුලු කම්කරු පරිපාලන සේවා හා කම්කරු ප්‍රශ්න ගැන ප්‍රවීනතාවයක් ඇති අධිකරණ බලධාරීන්ගේ භූමිකාව සමාලෝචනය කළ යුතු ය. අවශ්‍ය වේ නම් සවිමත් කළ යුතු ය.

45. සෞඛ්‍ය සේවා සහ HIV/AIDS සම්බන්ධව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඒකාබද්ධ මෙහෙයුම් නිර්නායක, 2005 හා මොනම හෝ තදන්තර සංශෝධන අනුගමනය කිරීම මගින් වැළැක්වීම, ප්‍රතිකාර, උවටැන් හා සහාය පහසුකම් ලබා ගැනීමට පුලුල් ප්‍රවේශයන් සහතික කිරීමත්, HIV සහ AIDS මගින් පොදු සේවා කෙරෙහි - විශේෂයෙන් මහජන සෞඛ්‍ය සේවා කෙරෙහි, ඇති කරන වෙහෙස අඩු කිරීමත් සඳහා මහජන සෞඛ්‍ය පද්ධතීන් ශක්තිමත් කළ යුතු වේ.

*ජාත්‍යන්තර සහයෝගය*

46. මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ද්විපාර්ශවික හෝ බහු පාර්ශ්වික ගිවිස්නා මගින් ද, බහුපාර්ශවීය පද්ධතීන් සමග සහභාගිත්වයෙන් ද හෝ වෙනත් ඵලදායී මාර්ගයන්ගෙන් ද සමාජික රටවල් සහයෝගීත්වය දැක්විය යුතු ය.

47. සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා HIV වැළැක්වීම, ප්‍ර තිකාරය, උවටැන සහ සහාය සැපයීමේ සේවාවන් තමන්ගේ රටෙහි දී, මාර්ගස්ථ රටවල දී හා ගමනාන්ත රටෙහි දී සැපයීම සඳහා ක්‍රියාමාර්ගයන් තිබිය යුතු අතර, සුදුසු අවස්ථා වල දී අදාල රටවල් අතර ගිවිසුම් ඇති විය යුතු ය.

48. සාමාජික රටවල් දෙකක් හෝ කිහිපයක් අතර ද, එම රටවල HIV සහ AIDS සම්බන්ධ ජාතික ව්‍යුහයන් අතර ද, අදාල ජාත්‍යන්තර සංවිධානයන් අතර ද, සහයෝගීතාවය ගොඩනගා ගැනීම උනන්දු කරන අතර, HIV සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට ගත් සියලුම ක්‍රියාමාර්ග පිළිබඳ ක්‍රමානුකූල තොරතුරු හුවමාරුව එම සහයෝගීතාවන්ට ඇතුලත් විය යුතු ය.

49. ආසාදනයන්ට අදාල වැළැක්වීම, ප්‍රතිකාර, උවටැන හා සහාය සම්බන්ධ ජාත්‍යන්තර ක්‍රමෝපායයන් සංවර්ධනයෙහි ලා සියලුම රටවලට අවශ්‍ය, විශේෂයෙන් තදින් ආසාදනය පවතින රටවලට, සම්පත් සැපයීමෙහි ද සම්බන්ධීකරණය කෙරෙහි ද සමාජික රටවල් හා බහුපාර්ශ්වික සංවිධාන විශේෂ අවධානය යොමු කළ යුතු ය.

50. HIV ආසාදනය, වෙනත් ඒ ඒ අවස්ථාවට පැන නගින ආසාදන සහ HIV සම්බන්ධ පිළිකා වැළැක්වීම, ප්‍රතිකාර සහ උවටැන සඳහා අවශ්‍ය ඕනෑම ආකාරයක උපකරණ හා සේවා වල මිල පහත හෙළීම සඳහා සමාජික රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන සොයා බැලිය යුතු ය.

## VI. මෙහෙයුම් කටයුතු

51. HIV සහ AIDS හා වැඩලෝකය පිළිබඳ තම ජාතික ප්‍රතිපත්තිය තුලින් පැන නගින කරුණු මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම හෝ පවත්නා යාන්ත්‍රනයක් ඇත්නම් එය භාවිතාවට ගැනීමත්, එය පිළිගැනීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ගොනු කිරීමත්, සාමාජික රටවලින් ඉටුවිය යුතු ය.

52. ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධව පැන නගින කරුණු මෙහෙයුම් කිරීමෙහි ලා ඇති කරගන්නා යාන්ත්‍රණය තුල, වැඩි නියෝජනයක් සහිත සේව්‍යයන් ගේ සහ සේවකයන්ගේ සංවිධාන වලට සම නියෝජන අවස්ථා තිබිය යුතු ය. ඊට අමතරව, යථෝක්ත යාන්ත්‍රණය යටතේ HIV සමග ජීවත්වන්නන් ගේ නියෝජිතත්වය ඇති සංවිධාන වල අදහස්, විශේෂඥ වාර්තා හෝ තාක්‍ෂණික අධ්‍යයන සැලකිල්ලට ගනිමින් මෙම සංවිධාන වල උපදෙස් අවශ්‍ය සෑම විටම ලබාගත යුතු වේ.

53. හැකිතාක් දුරට සවිස්තරාත්මක තොරතුරු සහ සංඛ්‍යාන දත්ත එකතු කිරීම සහ ජාතික මට්ටම් වල දී වැඩ ලෝකය තුල HIV සහ AIDS පිළිබඳ පැනනගින කරුණු සම්බන්ධ පර්යේෂණ කිරීම ද, සමාජික රටවල් විසින් ඉටු කළ යුතු ය. මෙම පර්යේෂණ වල දී ස්ත්‍රී පුරුෂ වශයෙන් පුද්ගලයන් ගේ ව්‍යාප්තිය ද, අනෙකුත් අදාල දත්තයන් ද සැලකිල්ලට ගත යුතු ය.

54. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථාවේ 19 වන වගන්තිය යටතේ වාර්තා සැපයීමට අමතරව, මෙම නිර්දේශය පාදක කරගෙන ගත් පියවරයන් පිළිබඳ විධිමත් වාර්තාවක් UNAIDS ආයතනයට යැවෙන ජාතික වාර්තාවලට මෙන්ම වෙනත් අදාල ජාත්‍යන්තර උපකරණ යටතේ සකස් වන වාර්තා වලට ද ඇතුළත් කළ හැක.

# ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ
# 99 වන සැසිවාරයේ දී
# සම්මත කරගත් යෝජනා

(ජිනිවා, ජූනි 2010)

....

## II

## HIV සහ AIDS හා වැඩ ලෝකය සම්බන්ධ නිර්දේශයන් ප්‍රවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාවල 2010 [1]

ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි මහා සම්මේලනයේ 2010 පැවැත්වුන 99 වන සැසි වාර රැස්වීමේ දී, HIV සහ AIDS හා වැඩලෝකය සම්බන්ධ නිර්දේශයක් 2010, සම්මත කර ගෙන,

එම නිර්දේශයන් ගේ සාර්ථකත්වය පවත්නේ එහි දැක්වෙන අවශ්‍යතාවයන් ඵලදායී ලෙස ප්‍රවර්ධනයත්, ක්‍රියාත්මක කිරීමත් මත බව සැලකිල්ලට ගෙන,

සංවිධානයේ විධි නියෝගයේ හරය වන්නේ සුනිසි මෙහෙවරත් යා දෙන ව්‍යවසායනුත් ප්‍රවර්ධනය බව සිත් හි දරා ගෙන,

HIV/AIDS සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන (UNAIDS) තුල HIV සහ AIDS සම්බන්ධ ව්‍යායාමයන් ආමන්ත්‍රණය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය ත්‍රෛපාර්ශ්වික සංවිධානයක් ලෙස සහභාගිවන බව සැලකිල්ලට ගනිමින්,

1. පවත්නා අයවැය සීමාවන් ඇතුලත සම්පත් වෙන් කරදෙන ලෙසත්, ත්‍රෛපාර්ශ්වීය කොටස් සමග එක්ව වැඩලෝකය තුල මෙම නිර්දේශයන් සඵලව ක්‍රියාත්මක කරනු පිණිස අයවැයෙන් පිටස්තර අතිරේක සම්පත් සොයා බලන ලෙසත් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී.

2. වැඩබිම තුල HIV සහ AIDS සම්බන්ධව විවිධ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාවයෙන් යුතුව ප්‍රයත්නයන්හි යෙදීමෙහි ලා ක්‍රියාකාරී වන ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී.

3. වැඩබිම තුල HIV සහ AIDS නිසා ඇතිවන බලපෑම අඩුකිරීම වෙනුවෙන් මෙම නිර්දේශයන් පුලුල්ව ක්‍රියාත්මක කිරීම සාර්ථක කරගනු සඳහා, ගෝලීය ක්‍රියාකාරී සැලසුමක් ස්ථාපිත කරන ලෙස ද පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී. HIV/AIDS සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන (UNAIDS), HIV සහ AIDS සමග ජීවත්වන පුද්ගලයන් ගේ සංවිධාන සහ වෙනත් අදාල හවුල් කරුවන් ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රියාකාරී සැලැස්ම සැකසිය යුත්තේ නියෝජනයක් සහිත සේව්‍යයන්ගේ සහ සේවකයන්ගේ සංවිධාන සමග ය.

[1] **2010 ජූනි 16 දින සම්මත කර ගන්නා ලදී**

4. එක්සත් ජාතීන්ගේ කම්කරු කාර්යාලයේ තාක්ෂණික සහයෝගිතා සම්පත් සාධාරණ ප්‍රමාණයක් සැපයීමට සැලකිල්ල යොමු කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා සිටින ලෙස පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී. පහත සඳහන් විෂයයන්ට අදාලව නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සාමාජික රටවල් හා වඩාත් නියෝජනයක් සහිත සේවකයන් ගේ සහ සේවායන්ගේ සංවිධාන විසින් උපකාර ඉල්ලා සිටිනු ඇත:

(අ) නිර්දේශයන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ත්‍රෛපාර්ශ්වික ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යවස්ථා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික උපකාර;

(ආ) පුහුණු කිරීම, සන්නිවේදනය කිරීම, මෙහෙයුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ධාරිතා වර්ධනය කිරීම සඳහා පිහිට වීම, උදාහරණ වශයෙන්:

i. ඒ ඒ අංශයන් කෙරෙහි අවධානයක් ඇතිව ධාරිතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම, හා පුහුණු උපකරණ සැකසුම;

ii. සේවායන් ගේ හා සේවකයන් ගේ සංවිධානවල නියෝජිතයන් හා කම්කරු පරිපාලකයන් ඇතුලු පිරිස් පුහුණු කිරීම;

iii. නිර්දේශයන්ට අදාල ප්‍රචාරණ මෙවලම් හා නිර්දේශයට පක්ෂව කරුණු සපයන මෙවලම් සැකසීම; සහ

iv. නිර්දේශ ප්‍රචාරණය කිරීමට ජාතික හා කලාපීය සමුලු හා වැඩමුලු පැවැතීම

5. ප්‍රගතිය සමාලෝචනය, පැනනගින කරුණු මෙහෙයුම් කිරීම සහ වැඩ ලෝකයට අදාලව HIV සහ AIDS සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උචිත යහපත් පරිචයන් පිළිබඳ උදාහරණ හුවමාරු කරගැනීම සඳහා දැනට පවත්නා යාන්ත්‍රණයන් ජාතික මට්ටමේ භාවිතාවට ගැනීම හෝ නව යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා සමාජික රටවලට ආරාධනා කර සිටී.

6. දැනට පවත්නා වාර්තාකරණ යාන්ත්‍රනයන් ගේ කොටසක් ලෙස - විශේෂයෙන් පොදු සමීක්ෂණ ඇතුලත්ව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථාවේ 19 වන වගන්තියට අනුව විධිමත් වාර්තා සැපයීම සාමාජික රටවලින් ඉල්ලන ලෙස පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී. HIV සහ AIDS සම්බන්ධව රජයන් විසින් සකස් කරන වාර්තා වඩාත්ම නියෝජනයක් සහිත සේවකයන්ගේ සහ සේවායන්ගේ සංවිධාන සමග සාකච්ඡා කර සැකසිය යුතුවාක් මෙන්ම, ලබාගත් ප්‍රගතිය හැකි සැමවිටම යහපත් පරිචය පිළිබඳ උදාහරණ සහිතව ඉදිරිපත් කළ යුතු ය.

7. නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය වාරිකව සමාලෝචනයට කරන ලෙස පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී.

8. වෙනස් ලෙස සැලකීම (රැකියා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතියේ 1958, 1(1) (b) වගන්තියට එකතු කර ඇති කරුණු සාමාජික රටවල ප්‍රචාරණය කරන ලෙසත්, ඒ අනුව එම සම්මුතිය යටතේ ලබාදුන් ආරක්ෂාව සැබෑ හෝ අනුමාන කළ HIV ආසාදිතයන් ද හසුවන සේ ක්‍රියාත්මක කරන ලෙසත් පාලන මණ්ඩලයට ආරාධනා කර සිටී.

....



ISBN 978-92-2-824346-8